# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි දෙවන වසර පරීක්ෂණය - 2019/2020

## නර්තන හා නාට්‍ය කලා පීඨය

## **සම්භාව්‍ය සාහිත්‍යය අධ්‍යයනය – DSAD 22052**

කාලය :- පැ 02

- **සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.**

---

- **ප්‍රශ්න පහකින් (05) සමන්විත ය.**
- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට (02) පමණක් පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.**

---

1. පහත සඳහන් පද්‍ය පන්තිය රසාස්වාදය කරන්න.

දිවා භෝජනය

අට වයස් නොදරුවා<br>
හැට පිරුනු කලු සමින්<br>
වැසුනු ඇට සැකිල්ලකි.

එහෙත් ඔහු සිනාසෙයි;<br>
දත් පුරා සිනාසෙයි;<br>
කට පුරා සිනාසෙයි.

ඇට පෙනෙන මුහුන මත<br>
දෙකන තෙක් දිග් ගැහුනු<br>
සිනාවෙන් ඔහු මුහුන,<br>
පුරුදු නැති සිත්තරෙකු<br>
නොංචි කෝලමට කැපූ<br>
සරිය වෙස් මුහුනකට.

වමත පොල් කටුවෙ සිට<br>
කට ලඟට ගොස් වැටෙන<br>
ලී කැබෙල්ලකි සුරත.

බට්ටෙක් මෙන් ඔර්ලෝසුවෙ<br>
ගනන් බලා තුන් විඩයක්<br>
උඩහට පහලට ගිය අත<br>
හිස් පොල් කටුවේ<br>
ඒකවර නැවතින.

'පොඩි ලමයෝ<br>
බත්<br>
ඉවරද කාලා'

පුදුමයෙන් මෙන් බලා මා දෙස<br>
දෙකන තෙක් දික් සිනා පාලා<br>
විසි කොට පොල් කටුව කානුවෙ<br>
පිසදමයි අත ඉරුනු සරමේ. ( ලකුණු 20 යි )

අ.පි.බ

2. නිසඳැස් පද්‍ය රචකයා සමාජ අසාධාරණයට එරෙහි වූ ආකාරය ඔබ කැමති කවීන් දෙනකුගේ පද්‍ය නිර්මාණ ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

   **නැතහොත්**

   'කොළඹ කවියේ ජ්‍යෙෂ්ඨ කවීන්ගේ පද්‍ය රචනා ජාත්‍යාලය වර්ධනය කිරීමෙහි ලා භාවිත වූයේ ය' විමසන්න.

3. 'සරල භාෂා ව්‍යවහාරය හෙළ හවුලේ කවීන්ගේ පද්‍ය නිර්මාණයන්හි කැපී පෙනෙන විශේෂත්වයකි' මේ ප්‍රකාශයට ඔබ එකඟ වන්නෙහි ද ?

4. 'සිංහල සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍යයේ පරමාර්ථය වූයේ ආනන්දය සහ ප්‍රඥාවයි' ඔබේ අදහස් දක්වන්න.

5. ජාතක පොතෙහි මූලික අරමුණවන්නේ ස්ත්‍රීන්ගේ දුර්වලතා විවේචනයට ලක් කිරීම බවට ඇති මතයෙහි යුක්තියුක්ත භාවය පරීක්ෂා කරන්න.

   **නැතහොත්**

   චරිත නිරූපණයේ දී ජාතක කථා කතුවරයා දැක්වූ කුශලතාව අගයන්න.

(ලකුණු 15 බැගිනි)

…………………… **2023.07.07**